# කැලෑ ගමේ වීරයෝ



ඩබ්ලිව්. ආවින්දි රැහන්සා වීරපටබැදි

# කැලෑ ගමේ වීරයෝ

ඩබ්ලිව්. ආවින්දි රුහන්සා වීරපටබැඳි

# කැලෑ ගමේ වීරයෝ

කතෘ : ඩබ්ලිව්. ආවින්දි රුහන්සා වීරපටබැඳි

පාසල : මහ/උසස් බාලිකා විදුහල

ප්‍රථම මුද්‍රණය : 2025

ISBN අංකය : 978-624-208-669-9

# පිදුම

**සැමදා මා දිරි ගන්වන**

**අම්මා තාත්තා**

**අත්තා සහ අත්තම්මා**

**වෙත පුදමි.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එක්තරා කාලෙක ලොකු ඉඩෝර
කාලයක් ආවා. කැලේ තිබුණු
වැව්, පොකුණු සියල්ල හිඳී ගියා.
සත්තු හුඟක් වතුර නැතුව
කලන්තය හැදිලා වැටිලා හිටියා.

චූටි සත්තු කිහිප දෙනෙක් මැරුණා.
තරුණ ගෝනෙක් කට්ටියට
මෙහෙම කිව්වා.
''මේ ඉඩෝරයෙන් අපි සේරම මැරේවි.
අර ඈත කන්ද උඩ කුරුල්ලෝ
කෑ ගහනවා එතන වලක වතුර ඇති.''





''මං ගිහින් බලලා එන්නම්.''
එහෙම කියලා ඒ ගෝනා කිව්වා.
මගේ උදව්වට කව්රු හරි එනවද
කියලා. ''අපි එනවා, අපි එනවා''
කියලා සත්තු කෑ ගැහුවා.
''එක්කෙනෙක් ඇති'' කියලා ගෝනා
කිව්වා. ඊට පස්සේ තව මුවෙක්
එක්ක ඌ කන්ද මුදුනට ගියා.

කන්ද මුදුනේ ලොකු වතුර වලක් තිබ්බා. ඒක දැකපු ගෝනටයි, මුවාටයි හරිම සතුටක් දැනුනා. වතුර.. වතුර.. කියලා දෙන්නම කෑගැහුවා. '' මේ වතුර පහලට ගෙනියන්නේ කොහොමද?'' කියලා මුවා ඇහුවා.





''අපි මෙතන ඉඳලා ඇලක් හාරමු''
කියලා ගෝනා කිව්වා. ''අපි
කන්ද පාමුල ලොකු වලක් හාරමු.''
''මං ගිහිං කට්ටියට කියලා වලක්
හාරන්නම්.'' කියලා මුවා ආවා.
වතුර ගැන අනිත් සතුන්ට කිව්වා.



''අපි මෙතන වලක් හාරමු.'' අනික්
සත්තු ඇහුවා. මේ වේලිච්ච
පොළොවේ වලවල් හාරන්නේ
කොහොමද? කියලා. අපිට පුළුවන්
කියලා. කුළු මීමෝ කිව්වා.
හරි අපි වැඩ පටන් ගනිමු.



කියලා උන් තමන්ගේ ශක්තිමත්
අං වලින් ඇනලා පොළොව බුරුල්
කළා. අනික් සත්තු උදවු කළා.
අන්තිමට ලොකු වලක් හාරන්න පුළුවන්
වුණා. කන්ද උඩ හිටිය තරුණ
ගෝනා ඒ වල ළඟටම ඇලක් හෑරුවා.

ඇළ දිගේ වතුර ඇවිත් වල පිරුණා.
සත්තු සතුටු වුණා. සත්තු
වතුර බීලා මහන්සිය නිවා ගත්තා.
ගෝනට ස්තූති කළා.





ආවින්දි රුහන්සා වීරපටබැදි

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN : 978-624-208-669-9